# නූතනත්වය හා ජාතිකත්වය

මුළු බටහිර නොවන ලෝකය පුරා අද ඇත්තේ ගෝලීයකරණය හා ජාතිකත්වය අතර අරගලයකි. ගෝලීයකරණය යනුවෙන් බටහිරයන් විසින් හැඳින්වෙන ප්‍රපංචය ඔවුන්ට කෙසේ වෙතත් අපට නම් අවුරුදු පන්සියයකට වඩා පැරණි ය. ගෝලීයකරණය ඇරඹුණේ දකුණු යුරෝපයේ ඊනියා පුනරුදයත් සමග ය. පුනරුදය යන්න බටහිරයන් කෙසේ කීව ද චින්තන විප්ලවයක් විය. ඒ යුරෝපීය මධ්‍යකාලීන (මධ්‍යකාලය ලෝකයට ම පොදු වූවක් යැයි බටහිර බුද්ධිමතුන් අපට කියා සිටිය ද, ඒ යුරෝපයට සාපේක්ෂ විය.) කතෝලික චින්තනයෙන් බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට මාරුවීම ය. චින්තන විප්ලවයක් යන්න සුසමාදරශී වෙනසකට (පැරඩයිම් ෂිෆ්ට්) වඩා ගැඹුරු ය. එක් චින්තනයක සුසමාදර්ශ කිහිපයක් තිබිය හැකි ය.

යුරෝපීය චින්තන විප්ලවයෙන් පසු සමාජය (සමස්තය) පසුපසට තල්ලු කර පුද්ගලයා ඉදිරියට පැමිණියේ ය. පුද්ගල ඉන්ද්‍රිය පිනවීම පුද්ගලයාගේ ප්‍රධාන කර්තව්‍යය විය. සංයුක්ත සංකල්ප හා ප්‍රවාද වෙනුවට වියුක්ත සංකල්ප හා ප්‍රවාද සමාජයෙහි තහවුරු විය. බටහිරයන් සිතන්නේ ද්වීමය ප්‍රතිපක්ෂ (බයිනරි ඔපසිෂන්ස්) ආධාරයෙනි. මේ ප්‍රතිපක්ෂවලින් එකක් අනෙකට වඩා ප්‍රධාන වෙයි. කතෝලික චින්තනයෙහි සමස්තය හා සංයුක්තය වෙනුවට නව චින්තනයෙහි පුද්ගලිකත්වය හා වියුක්තය ප්‍රධාන ප්‍රතිපක්ෂ විය. බටහිර ගණිතයෙහි භාවිතාවන ග්‍රීක ස්වසිද්ධිමය විධික්‍රමය (ඇක්සියොමැටික් මෙතඩ්) හා ඒ හා සම්බන්ධ ඌනිතවාදය යුරෝපීය බුද්ධිමතුන් අතර පිළිගැණිනි. ඒ අතර වඩාත් භයානක කරුණක් සමාජයෙහි තහවුරු විය. බටහිරයන් ඊනියා පුනරුදයත් සමග එය ලබාගත්තේ යුදෙව් චින්තනයෙනි. ඒ අන් කිසිවක් නොව තම සංස්කෘතිය ලෝකය පුරා බලහත්කාරයෙන් ව්‍යාප්තකිරීම ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඒ හැරෙන්නට යුදෙව් චින්තනයෙන් වියුක්ත සංකල්ප හා ප්‍රවාද ලබාගත්තේ ය.

නව චින්තනය ක්‍රිස්තියානි චින්තනයෙන් ලබාගත්තේ පුද්ගලිකත්වය ය. අප එයට ක්‍රිස්තියානි චින්තනය යැයි කීව ද පුනරුදය ඇරඹුණු සමයෙහි ක්‍රිස්තියානි ආගමක් නො වී ය. ක්‍රිස්තියානි ආගම ඇතිවුණේ මාටින් ලූතර් පූජකවරයාගේ ප්‍රධානත්වයෙන් 1517න් පසුව ය. අප සිතන අයුරින් ආගමක් ඇසුරෙන් සංස්කෘතියක් බිහිවනවා නොව සංස්කෘතියක ආගමක් ඇතිවෙයි. බුදුදහම පවා ඇතිවුණේ අර්ධ වෛදික සංස්කෘතියක ය. එවැනි සංස්කෘතියක නූපදින්නට සිදුහත් කුමරු බුද්ධත්වයට නොපැමිණීමට තිබුණි. (වැඩි විස්තර සඳහා විදුසර අපේ ප්‍රවාද ලිපි පෙළ කියවන්න). පස්මහා බැලුම් බැලීමෙහි වැදගත්කම ද එය ය. බෝසතාණන් වහන්සේ ඇස්කිමෝවරයකු ලෙස ඉපදිණි නම් කුමක්වීමට තිබුණි ද?

කතෝලික සමස්තය වෙනුවට පුද්හලිකත්වය ප්‍රධානකොට සැලකීම ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ලක්ෂණය වෙයි. මාටින් ලූතර් පූජකවරයා පාප්වහන්සේට විරුද්ධව කැරලි ගැසුවේ සමස්තය ඔස්සේ පැමිණි ආධිපත්‍යයට එරෙහිව ය. පුද්ගලයන්ට සමාජයෙන් මෙන් ම පල්ලියෙන් ද රාජ්‍යයෙන් ද ස්වාධීනත්වය තිබිය යුතු ය යන අදහස ක්‍රමයෙන් යුරෝපයේ පැතිරී ගියේ ය. මේ අදහස කෙතරම් තදින් එංගලන්තයේ පැතිරී ගියේ ද කිවහොත් එමගින් පුද්ගලයා සමස්තයෙන් හා සියළු බැඳීම්වලින් කඩනු ලැබී ය. සමස්තය යන්නට පුද්ගලයන් සමූහයක් එක් භූතාර්ථයක් (එන්ටිටි) ලෙස සැලකීම පමණක් නොව ඔවුන් හා ඉඩම් අතර තිබූ බැඳීම ද විය. ඉඩමෙන් වෙන්කරනු ලැබූ පුද්හලයාට යන එන මං නැති විය. ඔහුට කළහැකි එකම කාර්යය වූයේ තම ශ්‍රමය විකිණීම පමණ ය. එංගලන්තයේ ඒ ඒ තැන්වල නගර ගොඩනැගී ඉඩමින් ඊනියා නිදහසක් ලද පුද්ගලයන්ට තම ශ්‍රමය විකිණීමට ආයතන ඇතිකෙරිණි. මාක්ස්වාදයෙහි දක්නට ලැබෙන ශ්‍රමය සූරාකන ධනපතියන් හා ශ්‍රමය විකුණන කම්කරුවන් ඇතිවුණේ ඒ ආකාරයට ය. එංගලන්තයෙහි එලෙස ඉඩම් පාළුවට ගිය ආකාරය ගෝල්ඩ්ස්මිත්ගේ ද ඩෙසර්ටඩ් විලේජ් (පාළුගම) කෘතියෙහි විස්තර කෙරෙයි.

තම සංස්කෘතිය ලෝ පුරා ව්‍යාප්තකිරීම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි එක් ලක්ෂණයක් විය. ඒ පටන්ගනු ලැබුයේ ස්පාඤ්ඤය හා පෘතුගාලය විසිනි. ඒ රටවල් දෙකම කතෝලික රටවල් වූ අතර ලෝක ආධිපත්‍යය ලබාගැනීම සඳහා ඔවුන්ට පාප්වහන්සේගේ ආශිර්වාදය පසළොස්වැනි සියවසේ අගභාගයේ දී ලැබුණි. එහෙත් තමන් මේ ක්‍රියාත්මක කරන්නේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි අවශ්‍යතාවක් බව ඔවුහු නො දත්හ. සියවස් කිහිපයක් ඇවෑමෙන් කතෝලික සංස්කෘතිය වෙනුවට යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෝකය පුරා ආධිපත්‍යය පිහිටුවන බව

© Prof. Nalin De Silva

ඔවුහු නො දත් හ. එලෙස ඉතාලිය හා අනෙක් බලවත් කතෝලික රටවල් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ ව්‍යාප්තියට අත දුන්නේ එහි දී පමණක් නො වේ.

කතෝලික සංයුක්ත සංකල්ප වෙනුවට ක්‍රිස්තියානි වියුක්ත සංකල්ප ඇති කෙළේ කතෝලිකයකු වූ ගැලීලියෝ ය. ඉර පොළොව වටා යැම අනුභූති සංයුක්ත සංකල්පයකි. ඒ ඉන්ද්‍රිය ගෝචර ය. එහෙත් පොළොව ඉර වටා යැම අනුභූතියට එකඟ නැත. පොළොවේ සිටින කිසිවකුටවත් පොළොව ඉර වටා යැම ඉන්ද්‍රිය ගෝචර අත්දැකීමක් නො වේ. පාප් වහන්සේ ගැලිලියෝට විරුද්ධවීම පුදුමයක් නො වේ. නැගී එන පෞද්ගලිකත්වයේ සංකේතය ලෙස ඩේවිඩ් ප්‍රතිමාව නිර්මාණය කළ මිචලාංජිලෝ ඉතාලියේ පිරෙන්ට්සි නගරයෙහි විසූ කතොලික බැතිමතෙකි. මාටින් ලූතර් පූජකවරයා ද ආරම්භයේ දී කතෝලික පූජකවරයෙක් විය. කතෝලික චින්තනය එවකට වඩාත් ම පැතිරීගිය ඉතාලියෙහි ආරම්භ වූ මේ සියල්ල කෙළවරවූයේ එහි ප්‍රතිඵලයක් ලෙස අවසානයේ දී කතෝලික චින්තනය හා කතෝලික සංස්කෘතිය පරාජය වීමෙනි.

බටහිර විද්‍යාවට පදනම සකස්කෙළේ පුනරුදය ය. පුනරුදයෙන් ආරම්භ වූ මේ සමස්ත ක්‍රියාවලිය අපි නූතනත්වය ලෙස හඳුන්වමු. ඇතැමුන් ඊනියා පශ්චාත්නූතනත්වයක් ගැන කතාකළ ද තවමත් නූතනත්ව ව්‍යාපෘතිය අවසන් වී නැත. අද ගෝලීයකරණය යනුවෙන් හැඳින්වෙන්නේ නූතනත්වයේ එක් අංගයක් ලෙස බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය අනෙක් රටවල ජනයා මත බලයෙන් හෝ උපක්‍රමයෙන් හෝ පැටවීම ය. බටහිර විද්‍යාව මෙන් ම ධනවාදය ද නූතනත්වයේ එනම් පුනරුදයෙන් ආරම්භ වූ ක්‍රියාවලියෙහි ප්‍රතිඵල වෙයි. යටත්විජිතවාදය හා එහි සංරචක වූ ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික යටත්විජිතවාද ද නූතනත්වයේ ප්‍රතිඵල ය. මේ සංරචක තුන එකිනෙකින් ස්වායත්ත නොවනබවත් එකක් අනෙකට ඌනනය කළහැකි බවත් බටහිරයෝ විශ්වාස කරති. ඔවුන්ට අනුව අනෙක් සංරචක දෙක ආර්ථිකයට ඌනනය කළහැකි ය. බටහිරයන්ට විශාල ධනස්කන්ධයක් ගොඩනගා ගත හැකිවූයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විසින් යුදෙව් ආකල්පයක් වූ දෙවියන් වහන්සේ ලෝකය මවා ඇත්තේ මිනිසා වෙනුවෙන් ය යන්න ද අවශෝෂණය කෙරී ඇති නිසා ය. ස්වාභාවික සම්පත් තවදුරටත් සම්පත් ලෙස නොසළකා එය මුදල් බවට පත්කෙරිණි. අපට තවදුරත් සම්පත් නැත. ඇත්තේ බටහිරයන් පසුපස ගොස් ලබාගත් ඊනියා භාණ්ඩ සංකල්පය පමණ ය.

පුනරුදයෙන් ඇරඹූ ක්‍රියාවලිය විසින් සෑම රටක ම ජනතාව ගොනාට අන්දනු ලැබී ඇත. පුද්ගලයාට එමගින් රාජ්‍යයට ප්‍රතිපක්ෂව නිදහස  හා අයිතිවාසිකම් ලබා දී ඇතැයි කියැවෙයි. මේ සියළු නිදහස් හා අයිතිවාසිකම් යම් යම් පුද්ගල අයිතීන් බව පැහැදිලි ය. එහෙත් බටහිර විද්‍යාඥයන්ට හා ඔවුන් පිරිවරාගෙන සිටින අවශේෂ පුද්ගලයන්ට මේ පුද්ගල අයිතිවාසිකම් ඊනියා මානව අයිතිවාසිකම් වෙයි. බටහිරයෝ ඒ ඊනියා මානව අයිතිවාසිකම්වල ද ආධාරයෙන් අප වැනි රටවලට විනකරන සංස්කෘතික ආර්ථික හා දේශපාලනික යටත්විජිතවාද ක්‍රියාත්මක කරති. ලෝකයේ අනෙක් රටවල සංස්කෘතීන් යථා කාලයේ දී දුර්වල කිරීම හෝ නැතිකිරීම හෝ බටහිරයන් විසින් කෙරෙනු ඇත. ඒ සියල්ල කෙරෙන්නේ බටහිර නොවන රටවල ජාතිකත්වයන්ට එරෙහිව ය. එහි දී ප්‍රධාන වශයෙන්ම උපයෝගී කෙරෙන්නේ බටහිරයන් විසින් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි නිර්මාණයකෙරෙන දැනුම ය. මේ දැනුම ඊනියා වාස්තවික දැනුමක් ය යන බොරුව ලෝකය පුරා පැතිරවෙයි. මේ කිසිලෙසකින්වත් කුමන්ත්‍රණයක් නො වේ. අනෙක් සංස්කෘතීන් හා ජාතිකත්ව නැතිකිරීම බටහිරයන්ගේ කුමන්ත්‍රණ නො වේ. ඒ ඔවුන්ගේ ක්‍රියාදාමයෙහි ම කොටසක් පමණකි. අප ඉදිරිපත්කරන ප්‍රවාද ඊනියා කුමන්ත්‍රණ ප්‍රවාද නොවෙයි.

නූතනත්වයේ ඊළඟ පියවර වූයේ ඊනියා ආලෝකනනය (එන්ලයිට්න්මන්ට්) ය. බුද්ධිවාදය හෙවත් හේතුවාදය තර්කණය ආදිය මෙහි අංග වේ යැයි ඉගැන්වෙයි. එහෙත් මෙහි දී කරුණු තුනක් නො කියැවෙයි. එකක් ඔවුන් යොදාගන්නා ඇරිස්ටෝටලීය තර්කණය ලෝකයේ එකම තර්කණය නොවන බව ය. දෙවැන්න ඇරිස්ටෝටලීය තර්කණය නිවැරදිව යොදාගත්ත ද පූර්වායවවල (ප්‍රෙමිසස්) නිරවද්‍යතාව සොයා නොබැලෙන බව ය. තුන්වැන්න පූර්වායව ද ඇතුළු දැනුම ඊනියා යථාර්ථයක් නොව යම් චින්තනයකට සාපේක්ෂව ගොඩනැගෙන බව ය. මේ කරුණු සම්බන්ධයෙන් මුළු ලෝකය ම අඳුරේ තැබීම ඊනියා ආලෝකනනයෙන් කෙරෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva